නාවලපිටිය නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට නාවලපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වත්කම් ලේඛනය අනුව ගලි බවුසරය සහ ට්‍රැක්ටරයක වටිනාකම ලෙස රු.3,480,000 ක් ගිණුම්ගත කර තිබියදී නැවත ගලීරථයේ වටිනාකම රු.520,000ක් ලෙස දැක්වීම හේතුවෙන් මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂය රු.520,000 කින් වැඩියෙන් දැක්වේ.

(ආ) සභාව සතු නිසාන් වර්ගයේ ඩබල් කැබ් රථයක වටිනාකම රු.7,650,000ක් වුවත්, රු.7,600,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.50,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ජල බිල්පත් වටිනාකම රු.108,862 ක් වුවත්, රු.59,259 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.49,603 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතුව පැවති ස්ථාවර තැන්පතු 4කට අදාළ පොළිය රු.462,798 ක් වුවද, රු.350,917 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් පොළිය රු.111,881 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

කඩ කාමර වල අයිතිය ඉල්ලීම, මස්කඩ ටෙන්ඩරය සම්බන්ධව, අනවසර එළවළු වෙළඳාම හා රථගාලේ අයිතිය ඉල්ලීම සම්බන්ධයෙන් පාර්ශවකරුවන් 8 දෙනෙකු පැවරූ නඩු 8 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.15,330,048 ක් වූ ගිණුම් ශේෂ 2 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.1,004,432 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතු වටිනාකම රු.156,824,990 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයකට අනුව වසර 1-5 අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.429,633 ක් හා වසර 5 කට වඩා වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකල ශේෂවල වටිනාකම රු.12,997,592 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතු වටිනාකම රු.25,139,150 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1-5ත් අතර කාලයක් තිස්සේ නිරවුල් නොකල ශේෂ එකතුව රු.1,548,319 ක් වූ අතර, වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.6,967,346ක් වී තිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.22,754,230 ක් වූ ගනුදෙනු 5 ක් සම්බන්ධයෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 189 | රු.45,291 ක් වටිනා අහරු චෙක්පත් 3 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ

-----------------------------------------

1980 දෙසැම්බර් 31 දිනැති හා අංක 1980/46 දරන චක්‍රලේඛය

-----------------------------------------

| | |
|---|---|
| (i)1 ඡේදය | රජයේ තක්සේරුව අනුව මාසික කුලිය තීරණය කළ යුතු වුවත්, 2010 වර්ෂයේ සුපිරි වෙළඳපල, බස් නැවතුම්පොල අසළ කඩ කාමර හා අඹගමුව කඩ කාමර බදු දීමේදී එසේ කර නොතිබුණි. |
| (ii) 2 ඡේදය | වසර 5 කට වරක් තක්සේරුගත කුලිය සංශෝධනය කළ යුතු වුවත්, 2010 වර්ෂයේ බදු දුන් කඩ කාමර නැවත තක්සේරු කර නොතිබුණි. |
| (iii)7 ඡේදය | (i) සුපිරි වෙළඳ සංකීර්ණයේ හා බස් නැවතුම්පොළ අසල කඩ කාමර, මුල් බදු කරුවන් විසින් අතුරු බදු දී රු.10,500 සිට 30,000 දක්වා කුලී අයකරගෙන තිබුණි. |
| | (ii) මුල් බදු කරුවන් විසින් කඩ කාමර අතුරු බදු දී මාසික කඩ කුලියට අමතරව කඩ කාමර 7 කට එකවර ගෙවීමේ මුදල් රු.570,000 ක් අයකර ගෙන තිබුණි. |
| (iv) 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 චක්‍රලේඛයේ 12 ඡේදය | කඩ කාමර බදු ගැනුම්කරුට නගර සභාවේ අවසරයක් නොමැතිව බදු දේපලෙහි ව්‍යුහය වෙනස් කිරීම හෝ බදු දේපලට අලුතින් කොටස් එකතු කිරීම කළ නොහැකි වුවද, කඩකාමර වෙනස්කිරීම් සිදුකර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,918,138 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,165,012 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,753,125ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,753,125 ක වර්ධනයට බදු කුලී ආදායම රු.4,361,594 ක්, වෙනත් ආදායම් රු.2,329,319 ක හා ආදායම් ආධාර රු.3,015,927 ක වැඩිවීම මූලික වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 2 ක මුළු ජංගම වත්කම් හා මුළු ජංගම වගකීම් අතර, අනුපාතය පිළිවෙලින් 2.3:1, 1.79:1 සහ 1.69:1 ක් විය.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පැරණි නගර සභා ගොඩනැගිල්ල අධ්‍යාපන අමාත්‍යාංශයේ පුහුණු කටයුතු සඳහා ලබා දීමට සිදු වීමෙන් නගර සභාවට ලැබූ ආදායම අහිමි වී යාම මෙන්ම, නගරයේ ජනතාවට ලබා දිය යුතු සේවා සැපයීමටද නොහැකි වී තිබුණි.

2.4.2 වරිපනම්

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.14,203,797 ක් වූ හිඟ ශේෂයක් පැවතියද, වර්ෂය තුළ ඉන් අයකරගෙන තිබුණේ රු.4,333,001 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 30 ක් තරම් ඉතා අඩු අගයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.13,973,461ක් විය.

2.4.3 බදු කුලී

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.1,142,752 ක පොදු වෙළඳපොල කුලී මුදලක් පැවතියද, වර්ෂය තුළ ඉන් අයකරගෙන තිබුණේ රු.476,692 ක් එනම් සියයට 41 ක ප්‍රතිශතයක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.1,067,973 ක් වූ වෙළඳ ස්ථාන බදුකුලී හිඟ ශේෂයක් පැවතියද, වර්ෂය තුළ ඉන් අයකරගෙන තිබුණේ රු.267,195 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 25 ක තරම් ඉතා අඩු අගයක් විය.

2.4.4 වෙනත් ආදායම්

(අ) රථ වාහන කුලී ආදායම්

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.2,165,364 ක හිඟ ශේෂයක් පැවති අතර, මෙම ශේෂයෙන් වර්ෂයේ අය කිරීමේ ප්‍රතිශතය සියයට 48 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,914,665 ක හිඟයක් පැවතුණි.

(ආ) පොහොර විකිණීමේ ආදායම

සමාලෝචිත වර්ෂය අවසානයට පොහොර විකිණීමෙන් ලැබිය යුතු ආදායම රු.878,955 ක් විය. එම ශේෂය තුළ වසර 1 - 5 ත් අතර කාලයක සිට අයවිය යුතු රු.789,950 ක ශේෂයක්ද විය.

(ඇ) ජල ගාස්තු

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.914,483 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.113,200 ක මුදලක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 12ක තරම් ඉතා අඩු අගයක් විය.

2.4.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.313,956 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.2,842,000 ක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභාවේ සුපිරි වෙළඳ සංකීර්ණයේ පවතින නිවාස හා ඇතැම් කඩ කාමර බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නගර සභා ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ ඉදිකිරීමට යෝජිත වාණිජ සංකීර්ණය සඳහා ගොඩනැගිලි සැලැස්මක් පිළියෙල කර ගෘහ නිර්මාණ ශිල්පියෙකුට රු.1,000,000 ක් ගෙවා ඇතත්, 2016 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බස් නැවතුම්පල අංක 4 දරන කඩ කාමරය සභාවේ හිටපු සභාපතිවරයාගේ භාර්යාව වෙත ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව රු.2,250,000 කට 2010 මැයි 31 දින බදු දී තිබුණි. නගර සභාවේ සභාපතිවරයාද මැදිහත් වී කඩ කාමරය පෞද්ගලික පාර්ශවයකට අතුරු බදු දී රු.2,800,000ක මුදලක් ලබාගෙන තිබුණි. කඩ කාමරය අතුරු බදු දීමෙන් පසු 2010 ජූනි 30 දිනැති අංක 5152 දරන රිසිට්පතින් එකවර ගෙවීමේ (Key money) ලෙස සභාවට ගෙවා තිබුණු රු.1,000,000 ක මුදල මුල් බදුකරු අවිධිමත් ලෙස ආපසු ලබාගෙන තිබුණි.

(ආ) නගර සභාව සතු කඩ කාමර 7 ක් නගර සභා මන්ත්‍රීවරුන් විසින් අවිධිමත් ලෙස ලබාගෙන තිබුණි.

(ඇ) සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 4 කින් කුලී හා ටෙන්ඩර් මුදල් රු.4,318,210 ක් නොගෙවීම නිසා සභාව විසින් මුද්‍රා තබා තිබුණි. මෙම කඩ කාමර වලින් හිඟ මුදල් අය කර ගැනීමට හෝ වෙනත් පාර්ශවයකට ටෙන්ඩර් කර ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) කොත්මලේ පාරේ අංක 153 දරන ගොඩනැගිල්ල නගර සභා ආඥා පනතේ 36 (ඉ) II වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන එකවර මුදල් ගෙවීමේ (Key money) පදනමට අය කිරීමෙන් තොරව බදුකරුවන් දෙදෙනෙකුට රු.8,531 කට මාසික බදු කුලියකට දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී තිබුණි. බදුකරු හා නගර සභාව අත්සන් කළ බදු ගිවිසුමේ 21 වන වගන්තිය ප්‍රකාරව නගර සභාවට අවාසිදායක කොන්දේසි ඇතුළත් කර ගිවිසුම්ගත වී තිබුණි.

(ඉ) සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 173 දරන කුඩා සිනමා ශාලාව 2011 අගෝස්තු 23 දින පෞද්ගලික පාර්ශවයක් වෙත ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව, නගර සභා අඥා පනතේ අංක 36 (ඉ) II ඡේදයට අනුකූල නොවී දීර්ඝකාලීනව බදු දී තිබුණි. ගිවිසුමෙහි 05 ඡේදය ප්‍රකාරව ඇප සුරැකුම් ලබාගෙන නොතිබුණු අතර, 2016 දෙසම්බර් 31 දින වන විට රු.500,000 ක ටෙන්ඩර් මුදලක් අය විය යුතුව තිබුණි.

(ඊ) නගර සභාවේ සුපිරි වෙළඳ සංකීර්ණයේ ඉහළ මාලයේ නිවාස 5 ක් ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව, ගිවිසුමකින්ද තොරව බදු දී තිබුණු අතර, නිවසක වටිනාකම රු.2,302,600 ක් වුවත්, 2010 ඔක්තෝබර් 25 දින පැවති මහා සභා තීරණයක් අනුව අවම ලංසුව රු.1,000,000 ක් දක්වා අඩු කිරීමට තීරණය කර බදුදී තිබුණද, මෙම නිවාස සඳහා 2016 දෙසැම්බර් 31 දින වන විට රු.3,950,000 ක මුදලක් අය විය යුතුව තිබුණි.

(උ) සභාව විසින් විවිධ පාර්ශව වෙත ලබාදී තිබුණු රු.676,320 ක් වටිනාකම වූ අත්තිකාරම් 22 ක් සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී එකවර ගෙවීමේ මුදල් අය නොකර කඩ කාමර බදු දීම නිසා සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 12 කින් හා බස් නැවතුම්පොල අසල කඩ කාමර 28 කින් පිළිවෙලින් රු.8,410,833 ක් හා රු.26,444,076 ක මුදලක් 2016 දෙසැම්බර් 31 දින වන විට අය විය යුතුව තිබුණි.

(ආ) සුපිරි වෙළඳ සංකීර්ණයේ හා බස් නැවතුම්පොල අසල කඩ කාමර වලින් අයකර තිබූ කඩ කුලියද විධිමත්ව අයකරගෙන නොතිබුණු බැවින් 2016 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් රු.1,241,616 ක හා රු.205,236 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

(ඇ) ජයතිලක ක්‍රීඩාංගණනයේ ආපනශාලාව 2012 ජූනි 29 දින ක්‍රීඩා සමාජයක් වෙත බදු දීමෙන් 2017 පෙරබවාරි 2 වන විට රු.304,093 ක මුදලක් අය විය යුතුව තිබුණි.

(ඈ) සුපිරි වෙළඳ සංකීර්ණය වැසිකිළි පද්ධතිය 2016 පෙබරවාරි 24 දින බදු දී රු.77,545 ක් ඇප මුදල්ද ලබාගෙන නොතිබුණු අතර, බදුකරු විසින් බදු කුලියද නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් රු.267,833 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

(ඉ) තක්සේරුවක් ලබා නොගෙන නගර සභාව සතු වාණිජ ගොඩනැගිල්ලක් ටෙන්ඩර් කැඳවා අවම ලංසුව වූ රු.225,000 කට කාර්ගිල්ස් පෞද්ගලික සමාගමට 2008 පෙබරවාරි 25 දින පැවති මාසික සභා තීරණයට අනුව බදු දී තිබුණි. වර්ෂ 5කට වරක් බදු කුලිය අඩුවන ප්‍රතිශතයකින් වැඩිකර තිබූ අතර, කිසිදු පදනමකින් තොරව අවිධිමත්ව බදු අයකරගෙන තිබුණි.

(ඊ) ජයතිලක ක්‍රීඩා සංකීර්ණය වෙනුවෙන් අනුමත කාර්යය මණ්ඩලයක් නොවූ අතර, ක්‍රීඩා භූමි භාරකරු වෙත වගකීම පවරා තිබුණි. 2016 වර්ෂයට අදාළව රු.4,111,887ක ආදායමක් ක්‍රීඩාංගනයට ලැබී තිබුණු අතර, ආදායම් අය කිරීම හා පාලන කටයුතු කම්කරුවන් විසින් සිදුකර ගෙන තිබුණි. මුදල් පරිපාලනය සඳහා වගකිව යුතු නිලධාරියෙක් පත්කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්
--------------------------------------
සමාලෝචිත වර්ෂය අවසානයට රු.207,250 ක වටිනාකම වූ වත්කම් 2 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------
(අ) මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පද්ධතිය ඉදිකිරීම
-----------------------------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) 2016 වර්ෂයේ පුනරුදය පරිසර සංරක්ෂණ වැඩසටහන යටතේ නගර සභාවෙහි මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක් ඉදිකිරීම සඳහා රු.10,597,950 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. මෙම ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන නියමයන්ගෙන් බැහැරව යමින් ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 14 ක කාලයක් පමණක් ලබා දී තිබුණු අතර, භාෂාත්‍රයෙන් ප්‍රසම්පාදන දැන්වීම් පළ කර නොතිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමට පෙර රු.437,325ක් වටිනා කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි.

(ii) 2016 ඔක්තෝබර් 27 දින සිට දින 40 කින් කොන්ත්‍රාත්තුව නිම කළ යුතු වුවද, රු.5,378,483ක වැඩ නිම නොකර 2016 දෙසැම්බර් 26 දින වැඩ අවසන් වාර්තාව ඉදිරිපත් කර තිබුණි. එසේම 2016 දෙසැම්බර් 22 වන දින අවසන් බිල්පත් සකස් කර ඉදිරිපත් කර තිබූ අතර, තාක්ෂණ නිලධාරි, වැඩ අධිකාරි හා ඉංජිනේරුවරයා විසින් එම බිල්පත නිර්දේශ කර අනුමත කර තිබුණි.

(ආ) නගරයේ අබලන් පදික වේදිකා නඩත්තු කිරීම
------------------------------------------------------

2016 වර්ෂයේ නගර සභා අරමුදල් යටතේ නගරයේ අබලන් පදික වේදිකාවල කැටගල් ඉවත්කර නැවත සකස් කිරීම සඳහා රු.435,175 ක මුදලක් 2016 අගොස්තු මස ගෙවා තිබුණි. නමුත් මෙම පදික වේදිකා පෙර තිබූ තත්වයටම අබලන් ව පැවතුණි.

(ඇ) ඉඹුල්පිටිය ඔසු උයන සංවර්ධනය කිරීම
-----------------------------------------------

ඔසු උයන සංවර්ධනය කිරීම සඳහා වෙන්කරන ලද රු.100,000 ක මුදල 8.3m දිගට දැලක් ගැසීම සඳහා පමණක් වැය කර තිබුණි. මෙහි විශාල ගස් ඉවත් කිරීමක් සිදු නොකර ඖෂධ පැළ සිටුවීම හා ආවරණය නොකල පරිසරයක් තුළ ඖෂධ පැළ සිටුවා තිබුණි.

(ඈ) කොම්පෝස්ට් අංගනය වැඩි දියුණු කිරීම
----------------------------------------------

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.1,198,480 ක කොන්ත්‍රාත් වටිනාකමකට කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට ගිවිසුම්ගතවී තිබුණි. ප්‍රසම්පාදන නියමයන්ගෙන් බැහැරව යමින් ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 14 ක කාලයක් පමණක් ලබාදී තිබුණු අතර, ටෙන්ඩර් දැන්වීම් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් පළ කර නොතිබුණි. ව්‍යාපෘතිය නිම නොකර තිබියදී 2016 දෙසැම්බර් 22 දින බිල්පත ඉදිරිපත් කොට තිබුණු අතර, 2017 ජනවාරි 31 දින වන විටත් නොකල වැඩවල වටිනාකම රු.632,200 ක් විය.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
------------------------------------

නගර සභාවේ දිනකට එකතුවන මෙට්‍රික් ටොන් 8 ක පමණ කසල ප්‍රමාණය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට යොමු කර තිබුණි. මෙම ව්‍යාපෘතිය නගර සභාව හා Bio System Technology ආයතනය ගිවිසුම්ගතව ක්‍රියාත්මක කරමින් තිබූ අතර, කොම්පෝස්ට් පොහොර අලෙවියෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු.798,900 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

3.7 පාරිසරික ගැටළු
-------------------

ජයතිලක ක්‍රීඩාංගනය අසල නිවාස සංකීර්ණයක් හා පාසලක් තිබෙන ජනාකීර්ණ ප්‍රදේශයක නගර සභාවට අයත් පර්චස් 20 ක භූමිය තුල ගව ඝාතකාගාරය පවත්වාගෙන යන අතර, ඒ සඳහා පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) වැය විෂයයන් 60 ක් සඳහා සලසා දී තිබුණු රු.3,971,534 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 65 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 20 සිට සියයට 99 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 3 ක ඇස්තමේන්තු කර තිබූ රු. 402,000 ක ආදායමෙන් කිසිදු ඉපයීමක් සිදු කර නොතිබුණි.

(ඈ) ආදායම් විෂයයන් 7 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර සියයට 14 සිට සියයට 40 අතර පරාසයක විචලනයක් පවතුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහාද වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5. පද්ධති හා පාලනය
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම්කරණය

(ඇ) මුදල් හා බැංකු කටයුතු

(ඈ) වාහන පාලනය

(ඉ) ආදායම් පාලනය

(ඊ) ණයගැතියෝ සහ ණයහිමියෝ

(උ) කොන්ත්‍රාත් පාලනය